සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

25 | S | I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 12 - 2019

විභාග අංකය .............................

## ලංකා ඉතිහාසය I

කාලය පැය තුනයි.
අමතර කියවීම් කාලය මිනි. 10 යි.

- අමතර කියවීමේ කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.
- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත සියලු ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමග අමුණා භාර දෙන්න.

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.**

01. 1. මාතොට 2. මාන්තෙයි 3. මහවොට් 4. මහපුටු 5. මහාගාම (.....)

02. 1. බෝධිඝරය 2. රජ මාලිගා 3. දා ගැබ 4. පිළිමගෙය 5. උපෝසථාගාරය (.....)

03. 1. ලෝවාමහපාය 2. ලංකාතිලකය 3. අටදාගෙය
4. හැටදාගෙය 5. ගල්විහාරය (.....)

04. 1. රොබට් නොක්ස් 2. එමර්සන් ටෙනන්ට් 3. මේජර් ඩේවි
4. ක්වේරොෂ් 5. ජෝන් ඩොයිලි (.....)

05. 1. පාහියන්ගල 2. බටදොඹලෙන 3. උඩරංචාමඩම
4. හෝර්ටන්තැන්න 5. විල්පත්තු (.....)

06. 1. කිත්ති 2. මහාලාන කිත්ති 3. ලෝකේශ්වර
4. කේශධාතු කාශ්‍යප 5. ජගතිපාල (.....)

07. 1. හුරුලු වැව 2. ගිරිතලේ වැව 3. මින්නේරිය වැව
4. කවුඩුළු වැව 5. මහකනදරා වැව (.....)

08. 1. අමුණ 2. පිටවාන 3. ඇතුළුවාන
4. කලිඟු බැම්ම 5. සොරොව්ව (.....)

09. 1. සිංහල ජාතක පොත 2. එළුබෝධි වංසය 3. ධාතු මංජුසාව
4. කව්සිළුමිණ 5. දළදා සිරිත (.....)

10. 1. අස්ගිරි විහාරය 2. ගඩලාදෙණි විහාරය 3. ලංකාතිලක විහාරය
3. නියම්ගම්පාය 4. ඇම්බැක්ක දේවාලය (.....)

- **අංක 11 සිට 15 තෙක් වූ ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් පද යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11.
1. මල්වතු ඔය - අනුරාධග්‍රාමය
2. කනදරා ඔය - උපතිස්ස ග්‍රාමය
3. දැදුරු ඔය - උරුවේල ග්‍රාමය
4. කැළණි ගඟ - කල්‍යාණි
5. ගල් ඔය - දීඝගාම (.....)

12.
1. පාහියාං - පි - වියු - නි චුවාන්
2. ප්ලිනි - නැචුරාලිස් හිස්ටෝරියා
3. මෙගස්තිනිස් - ඉන්ඩිකා
4. අබුසයිද් - සිල්සිලාත් අල් තවාරිං
5. කොස්මස් - භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය (.....)

13.
1. පණ්ඩුකාභය රජු - ග්‍රාමසීමා ලකුණු කිරීම
2. මුටසීව රජු - මහමෙව්නා උයන ඉදිකිරීම
3. සූරතිස්ස රජු - සේන ගුත්තික ආක්‍රමණය
4. දේවානම්පියතිස්ස රජු - ශ්‍රී මහ බෝධිය වැඩම කරවීම
5. අසේල රජු - රෝහණ රාජ වංශය ආරම්භ වීම (.....)

14.
1. විජය කුමරු - විජායි කුමරිය
2. පණ්ඩුවාසදේව රජු - කාලිංග කුමාරි
3. පණ්ඩුකාභය රජු - ස්වර්ණපාලී
4. පළමු විජයබාහු රජු - තිලෝකසුන්දරී
5. නිශ්ශංකමල්ල රජු - කල්‍යාණවතී (.....)

15.
1. සැස්සේරුව ලිපිය - විහාරාරාම පාලනය පිළිබඳ තොරතුරු
2. ගොඩවාය ලිපිය - බදු වර්ග පිළිබඳ තොරතුරු
3. හෝපිටිගම ටැම් ලිපිය - වෙළෙඳපළ නීතිරීති
4. මහ ඇලගමුව ලිපිය - දස මහා යෝධයින් පිළිබඳ තොරතුරු
5. හැබැස්ස ලිපිය - උප රජවරුන් පිළිබඳ තොරතුරු (.....)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම/දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැලපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළවිට පහත දැක්වෙන සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ග්‍රීක මූලාශ්‍රය | (A) | රාජතරංගිණිය |
| 2. | ඉන්දීය මූලාශ්‍රය | (B) | බෞද්ධ රාජධානි පිළිබඳ විස්තරය |
| 3. | පෘතුග්‍රීසි මූලාශ්‍රය | (C) | සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳ ලුහුඬු සටහන් |
| 4. | චීන මූලාශ්‍රය | (D) | ඉන්ඩිකා |
| 5. | ඉංග්‍රීසි මූලාශ්‍රය | (E) | ලංකා ඉතිහාසය |

1. ADEBC 2. BCEDA 3. CBEAD 4. DAEBC 5. EBCDA (.....)

17. **X** **Y**

| | X | | Y |
|---|---|---|---|
| 1. | යාපහුව | (A) | vi බුවනෙකබාහු |
| 2. | කෝට්ටේ | (B) | i බුවනෙකබාහු |
| 3. | දඹදෙණිය | (C) | iv බුවනෙකබාහු |
| 4. | කුරුණෑගල | (D) | ii බුවනෙකබාහු |
| 5. | ගම්පොළ | (E) | iii විජයබාහු |

1. ABDEC 2. BAEDC 3. CDBEA 4. DBECA 5. EBDCA (.....)

18.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ඉහළ කඳුකර තණ බිම් | (A) | බෙල්ලන්බැඳි පැලැස්ස |
| 2. | කඳුකර ආශ්‍රිත විවෘත දඩයම් ස්ථාන | (B) | පල්ලෙමලල |
| 3. | පහතරට වියළි කලාපීය විවෘත ජනාවාස | (C) | හෝර්ටන් තැන්න |
| 4. | වියළි කලාපීය ගල්ලෙන් | (D) | පොතාන |
| 5. | වෙරළාශ්‍රිත විවෘත ජනාවාස | (E) | නාවලපිටිය |

1. AECBD 2. BCADE 3. CEADB 4. BEADC 5. EDABC (.....)

19.

| | X | | Y |
|---|---|---|---|
| 1. | කුරුන්ද වාපී | (A) | දෙවන අග්ගබෝධි රජු |
| 2. | ගංගාතට වාපී | (B) | පළමු විජයබාහු රජු |
| 3. | මණිහිර වාපී | (C) | මහාසේන රජු |
| 4. | බුද්ධගුණ වාපී | (D) | දෙවන මොග්ගල්ලාන රජු |
| 5. | පත්තපාෂාණ වාපී | (E) | පළමු අග්ගබෝධි රජු |

1. ABCDE 2. BDCEA 3. CBAED 4. DCEAB 5. EACBD (.....)

20.

| | X | | Y |
|---|---|---|---|
| 1. | කාලිංග මාඝ පරාජයට පත් කිරීම | (A) | පළමුවෙනි බුවනෙකබාහු |
| 2. | කාලිංගරායර හා චෝඩගංගගේ ආක්‍රමණයට මුහුණ දීම | (B) | වීර අලකේශ්වර |
| 3. | බෝධා මාපාණගේ කැරැල්ල | (C) | දෙවන පැරකුම් |
| 4. | චෙං හෝ සෙනෙවියාගේ කැරැල්ල | (D) | හයවන පැරකුම් රජු |
| 5. | විජය නගර් අධිරාජ්‍යයේ තොටුපළක් ආක්‍රමණය | (E) | හතරවන පරාක්‍රමබාහු |

1. ACEBD 2. BDEAC 3. CAEBD 4. DEBAC 5. EBACD (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. ආර්යය සංක්‍රමණ හා ජනාවාස
    1. ඉන්දියාවේ විවිධ ප්‍රදේශවල සිට විවිධ කාලවලදී ආර්යයන් ලංකාවට සංක්‍රමණය වීම.
    2. ශ්‍රී ලංකාවේ මුල්ම ආර්ය ජනාවාස තෙත් කලාපයේ ගංගා නිම්න ආශ්‍රිතව ව්‍යාප්ත විය.
    3. විජය කුමරු තම්බපණ්ණි ප්‍රදේශය මූලික කරගනිමින් ආර්ය ජනපද පාලනය කරන ලදි.
    4. භද්දකච්චායනා දේවිය උතුරු ඉන්දියාවේ ශාක්‍ය ජනපදයේ සිට ලංකාවට සංක්‍රමණය විය.
    5. පණ්ඩුකාභය රජතුමා තම මාමාවරුන් පරදවා ආර්ය ජනපදිකයන් අතර නායකත්වයට පත්වීම. (.....)

22. වටදාගෙය,
   1. චෛතියඝරය යන නමින්ද හඳුන්වනු ලැබේ.
   2. ලංකාවේ අලංකාරතම වටදාගෙය මැදිරිගිරියේ පිහිටා ඇති බව විශ්වාස කෙරේ.
   3. කුඩා දාගැබක් වටකොට ගල් කණු සිටුවා වටකුරු හැඩයෙන් යුක්තව ඉදිකළ ගොඩනැගිල්ල වටදාගෙයයි.
   4. ථූපාරාම දාගැබ සඳහා ද වටදාගෙයක් ඉදිකර ඇත.
   5. ජේතවනාරාමයට ඉදිකරන ලද වටදාගෙය ලංකාවේ විශාලතම වටදාගෙය ලෙස හඳුනාගෙන ඇත. (.....)

23. අලකේශ්වර පරපුර
   1. ඉන්දියාවේ කේරල ප්‍රදේශයේ පිහිටි වංචි පුරයේ සිට පැමිණි පිරිසකි.
   2. රයිගම ප්‍රදේශය මූලික කරගනිමින් විශාල බලයක් භුක්තිවිඳි පිරිසකි.
   3. පාහියන් හිමියන් විසින් අල්කෝර් හෙවත් අලකේශ්වර සුල්තාන් රජු ලෙස හඳුන්වා ඇත.
   4. නිශ්ශංක අලගක්කෝණාර ගම්පොළ රාජ සභාවේ අග්‍ර මන්ත්‍රීවරයා ලෙස සේවය කර ඇත.
   5. එළු අත්තනගලු වංශයේ අලගක්කෝණාර ශ්‍රී ලංකාධීශ්වර ලෙස හඳුන්වා ඇත. (.....)

24. කුරුණෑගල රාජධානිය
   1. කුරුණෑගල යුගයේ සිටි වැදගත්ම පාලකයා ලෙස සලකනු ලබන්නේ හතරවෙනි පරාක්‍රමබාහු රජුය.
   2. මාර්කෝ පෝලෝ නම් ඉතාලි ජාතික දේශ ගවේෂකයා ලංකාවට පැමිණීම.
   3. කුරුණෑගල යුගයේ දී දඹදෙණි රාජ වංසයේ අවසානය සිදුවිය.
   4. කුරුණෑගල යුගයේ ශාස්ත්‍රීය කටයුතු සඳහා වීරසිංහ පතිරාජ ඇමතිවරයාගේ සහාය නොඅඩුව ලැබීම.
   5. වීදාගම සනානන්ද පිරිවෙන ඉදිකිරීම. (.....)

25. රජරට ශිෂ්ටාචාරයේ ආර්ථිකය
   1. කෘෂිකර්මාන්තය පදනම් කරගත් ආර්ථිකය.
   2. හේන් ගොවිතැන හා මඩ ගොවිතැන ජනප්‍රියව පැවතීම.
   3. වගාකළ ධාන්‍ය වර්ග හා බෝග වර්ග පිළිබඳ තෝනිගල ලිපියේ සඳහන් වීම.
   4. දකපති හා බොජකපති හේන් වගාවෙන් අය කළ බදු වර්ග දෙකකි.
   5. වැව් අමුණු ඉදිකරමින් රජරට පාලකයෝ ආර්ථිකය දියුණු කිරීමට වෙහෙස වී කටයුතු කරන ලදි. (.....)

- **ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති A, B, C, D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

   A සහ B නිවැරදි නම් **1** ද     B සහ C පමණක් නිවැරදි නම් **2** ද

   C සහ D පමණක් නිවැරදි නම් **3** ද     A සහ C පමණක් නිවැරදි නම් **4** ද

   ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි ගණනක් නිවැරදි නම් අංක 5 ද වරහන තුළ ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A සහ C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජනයක් ලෙස කාලය හා අවකාශය පිළිබඳ අදහස් වර්ධනවීම සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේ ද ?
   A. අවකාශය යනු භෞතික පරිසරයයි.
   B. බුදුන් වහන්සේගේ බුද්ධත්වය ඇසුරින් බුද්ධ වර්ෂ ක්‍රමය ආරම්භ වී ඇත.
   C. ක්‍රිස්තුස් වහන්සේගේ උපත ඇසුරින් ක්‍රිස්තු වර්ෂ ක්‍රමය ආරම්භ වීම.
   D. රටක ඉතිහාසය විස්තර කිරීමේදී ඊට අදාල භූගෝලීය සාධක විස්තර කිරීමක් සිදු නොවේ. (.....)

27. ශ්‍රී ලංකාවේ දේශගුණ සාධක ඉතිහාසය කෙරෙහි ඇතිකළ බලපෑම සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේ ද ?
   A. මෝසම් වර්ෂාව පදනම් කරගෙන ශ්‍රී ලංකාව ප්‍රධාන දේශගුණික කලාප දෙකකට බෙදා වෙන් කළ හැකිය.
   B. වියළි කලාපයට වර්ෂාව ලැබෙන ක්‍රමය ඊසාන දිග මෝසමයි.
   C. නිරිත දිග මෝසම මඟින් මැයි - සැප්තැම්බර් කාලවලදී වර්ෂාව ලැබෙයි.
   D. ශ්‍රී ලංකාව ආසියාවේ පිහිටි සෞම්‍ය කලාපීය රටකි. (.....)

28. පුරා විද්‍යාත්මක මූලාශ්‍රය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද ?
   A. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය සම්බන්ධයෙන් තොරතුරු ලබාගත හැකි එකම මූලාශ්‍ර වර්ගයයි.
   B. මසූදි, බුර්දාද්බේ ආදීන්ගේ වාර්තා ලංකා ඉතිහාසය සම්බන්ධයෙන් වැදගත් විදේශීය පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වේ.
   C. අතීත සමාජයේ සංස්කෘතියට අයත් ඉතිරිව පවතින අවශේෂයන් පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ලෙස අර්ථ දැක්විය හැකිය.
   D. ඉතා වැදගත් අභිලේඛන වර්ගයක් වන සෙල්ලිපි වැදගත් පුරා විද්‍යාත්මක මූලාශ්‍ර විශේෂයකි. (.....)

29. රෝහණ රාජ්‍ය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද ?
   A. උත්තිය රජතුමාගේ අවධියේ දී රෝහණ රාජ්‍ය ආරම්භ විය.
   B. මහානාම යුව රජු රෝහණ රාජ වංසයේ ආරම්භකයාය.
   C. ගෝඨාභය රජු විසින් දසබෑ රජවරුන් පරාජයට පත් කරන ලදි.
   D. කාවන්තිස්ස රජු විසින් රෝහණය එක්සේසත් කිරීම සඳහා විවාහ සම්බන්ධතා උපයෝගී කරගන්නා ලදි. (.....)

30. තුන්වන විජයබාහු රජතුමාගේ ආගමික වැදගත්කම සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේ ද ?
   A. තුන්වන විජයබාහු රජතුමා වන්නි නිරිඳු නමින් හැඳින්වේ.
   B. බෙලිගල දළඳා මැදුර ඉදිකිරීම.
   C. දඹදෙණි විජයසුන්දරාරාමය කරවීම.
   D. ජම්බු ද්‍රෝණිය හෙවත් දඹදෙණිය මූලික කොටගෙන පාලන කටයුතු මෙහෙයවන ලදි. (.....)

- **අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. ඉතිහාසය යනු මානව වර්ගයා අතර සිදු වූ සිදුවීම්වල කතාන්දරය බවට අදහස් දක්වා ඇත්තේ කවුරුන් ද ?
   1. ක්‍රිස් හර්ට්ස් 2. ජෝන් ජේ 3. ජී.එම්. ට්‍රෙව්ලියන්
   4. ඩබ්.සී. සෙලර් 5. ආර්.ජේ.යෙට්මෑන් (.....)

32. පහත මූලාශ්‍රය අතරින් බුරුම වංශ කථාව නම් කරන්න.
   1. ජිනකාලමාලි 2. රාජතරංගිණිය 3. දිව්‍යාවදානය
   4. යසවන්ජෝ 5. සීලප්පදිකාරම් (.....)

33. භද්දකච්චායනා කුමරිය ඇතුළු පිරිස ලංකාවට ගොඩබට වරාය කුමක් ද ?
   1. දඹකොළ පටුන 2. ගෝකණ්ණ තිත්ථ 3. ඌරාතොට
   4. ලංකා පටුන 5. තම්බපණ්ණි (.....)

34. තම ගුරුවරයා වූ සංඝමිත්‍ර භික්ෂුවගේ උපදෙස් පිට මහා විහාරය විනාශ කළ පාලකයා කවුරුන් ද ?
   1. මහසෙන් 2. ජෙට්ඨතිස්ස 3. වලගම්බා
   4. චුල්ලත්තන 5. අමණ්ඩගාමිණී අභය (.....)

35. චෝලයන් විසින් රාජ රාජ පෙරුම්පල්ලෙයි යනුවෙන් නම් කර අනුග්‍රහ ලබාදුන් විහාරස්ථානය කුමක් ද ?
   1. කඳුරුගොඩ විහාරය 2. දෙමළ මහා සෑය 3. වෙල්ගම් විහාරය
   4. ගෝකණ්ණ විහාරය 5. සඳගිරි විහාරය (.....)

- **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4, සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. වෑත්තෑවේ හිමියන් විසින් ගුත්තිල කාව්‍ය රචනා කරන ලදි. | අනුරාධපුර පිහිටි ආලාහන පිරිවෙන රෝහල් සංකීර්ණයේ කැනීම් තුළින් ශල්‍ය උපකරණ රැසක් හමුවිය. (.....) |
| 37. කාලිංග මාඝගේ ආක්‍රමණය හේතුවෙන් පොළොන්නරු රාජධානිය බිඳ වැටුණි. | මාර යෝධයන් බඳු කාලිංග මාඝ හමුදාවේ කෲරකම් හමුවේ භීතියට පත් රජ රට ජනයා ආරක්ෂිත ප්‍රදේශවලට ගොස් ආරක්ෂාව සපයාගත් අතර සංඛ සෙනෙවි මිනිපේ ප්‍රදේශයේ ජනාවාස පිහිටුවාගන්නා ලදි. (.....) |
| 38. කිත්සිරිමෙවන් රාජ්‍ය සමයේ දී ශ්‍රී ලංකාවට දළදා වහන්සේ වැඩම කරවන ලදි. | ශ්‍රී මහා බෝධි රෝපණ උත්සවය සඳහා චන්දන ගාම, සදුන්ගාම, කාචරගාම ආදි ප්‍රදේශවල නායකයින් අනුරාධපුරයට රැස්විය. (.....) |
| 39. දුටුගැමුණු රජතුමාගෙන් අනතුරුව එතුමාගේ පුත් සාලිය කුමරු අනුරාධපුරයේ බලයට පත්විය. | සංඝමිත්තා තෙරණිය සමග ලංකාවට වැඩම කළ භික්ෂුණින් වහන්සේලාගේ නම් මහා වංසයේ සඳහන් වේ. (.....) |
| 40. පළමු විජයබාහු රජතුමා විසින් ශ්‍රී පාදස්ථානයට සිදුකළ දීමනාවක් පිළිබඳ තොරතුරු දෙවනගල සෙල්ලිපියේ සඳහන්වේ. | පළමු විජයබාහු රජුගේ අභාවයත් සමඟ ඇති වූ බල අරගලය නිසා රෝහණය අටදහස් රට හා දොළොස්දහස් රට යනුවෙන් කොටස් දෙකකට බෙදී වෙන්විය. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**25 | S | II**

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 12 - 2019**

විභාග අංකය .............................

## ලංකා ඉතිහාසය II

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයියි යුතු ප්‍රශ්න සංඛ්‍යාව 04 කි.**
  **(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් සපයා ඇත.)**

01. ඔබට සපයා ඇති ලංකා සිතියමෙහි පහත සඳහන් ස්ථාන සියල්ලම ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| i. යාපනය | ii. අලිගල | iii. කුරුණෑගල | iv. නාච්චදූව වැව |
| v. ගල් ඔය | vi. කල්‍යාණි ගාම | vii. බස්නාහිර පළාත | viii. ජප්ජර නදී |
| ix. ගෝකණ්ණතිත්ථ | x. මහනුවර | xi. ගොඩවාය | xii. දේව නගර |

(නිවැරදි ලකුණු කිරීමකට හා නම් කිරීමකට ලකුණු 1 බැගිනි.) (ල. 12)

02. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩගැසීම කෙරෙහි, ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර භූගෝලීය පිහිටීම වැදගත්වන ආකාරය පහත සඳහන් සාධක ඇසුරෙන් විස්තර කරන්න.
   i. මධ්‍යම කඳුකරයේ පිහිටීම.
   ii. වරායන්හි පිහිටීම. (ල. 16)

03. ශ්‍රී ලංකාවේ ''ලිඛිත ඉතිහාසයක් ආරම්භවීමට පෙර යුගය ප්‍රාග් ඓතිහාසික යුගයයි.''
   i. ප්‍රාග් ඓතිහාසික අවධියට අයත් දීර්ඝ කාලයක් පැවති යුගය කුමක් ද ? (ල. 1)
   ii. එම යුගයේ භාවිත කළ ආයුධවල තාක්ෂණික වර්ධනය පදනම් කරගනිමින් එම යුගය ප්‍රධාන අවධි දෙකකට බෙදා වෙන් කළ හැකිය. එම අවධි දෙක නම් කරන්න. (ල. 2)
   iii. ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ මානවයා ගේ ජීවන රටාව පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

04. පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණික වර්ධනයේ සුවිශේෂතා පිළිබඳ විග්‍රහ කරන්න. (ල. 8)

05. දෙස් විදෙස් අභියෝගයන්ට මුහුණ දෙමින් ලංකාව එක්සත් කර දේශපාලන හා ආගමික වශයෙන් විසල් මෙහෙවරක් කළ වළගම්බා රාජ්‍ය සමය ලංකා ඉතිහාසයේ වැදගත් කාල පරිච්ඡේදයකි. විමසන්න. (ල. 16)

06. වාරි තාක්ෂණය ශ්‍රී ලාංකික තාක්ෂණික දියුණුවේ උච්චතම අවස්ථාව විදහා දක්වයි.
   i. ශ්‍රී ලාංකික වාරි ඉතිහාසයේ මහ වැව් ඉදිකිරීමේ ආරම්භක පාලකයා කවුරුන් ද ? (ල. 1)
   ii. මහසෙන් රජු විසින් ඉදිකරවන ලද වැව් 04ක් නම් කරන්න. (ල. 2)
   iii. මහ පැරකුම් රජු දක්ෂිණ දේශයේ පාලකයා ලෙසත් ලංකාවේම පාලකයා ලෙසත් වාරිමාර්ග ඉදිකරමින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ගත් ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ල. 5)
   iv. ශ්‍රී ලංකාවේ රජ රට ශිෂ්ඨාචාරයේ වාරි තාක්ෂණය පිළිබඳ විමසුමක යෙදෙන්න. (ල. 8)

07. ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගය සම්බන්ධයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. පූර්ව ඓතිහාසික යුගයේ සිට මෙරට වාසය කළ ගෝත්‍රික ජන කොටස් 02ක් නම් කරන්න. (ල. 2)

ii. ඓතිහාසික යුගයේ දී ලංකාවට සංක්‍රමණය වූ ඉන්දියානු ජන කණ්ඩායම් 04ක් නම් කරන්න. (ල. 4)

iii. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්වරූපය හා ජීවන රටාව පිළිබඳ විමසුමක යෙදෙන්න. (ල. 10)

07. දෙවන පැරකුම් රාජ සමයේ වැදගත්කම පහත අංශ යටතේ විග්‍රහයක යෙදෙන්න. (ල. 16)

i. දේශපාලන වැදගත්කම

ii. ආගමික වැදගත්කම

08. කෝට්ටේ රාජධානි සමයේ අධ්‍යාපන හා සාහිත්‍ය අංශවල සිදුවූ දියුණුව පිළිබඳ විස්තර කරන්න. (ල. 16)

09. පහත සඳහන් මාතෘක අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ඉතිහාසය යනු කුමක් ද ?

ii. අනුරාධපුර යුගයේ පාලන තන්ත්‍රය

iii. යාපන රාජධානිය


iii. අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳවැටීම

(එක් සටහනකට ලකුණු 08 බැගින්)

# තෙවන වාර පරීක්ෂණය - 2019
## ලංකා ඉතිහාසය - 12 ශ්‍රේණිය
### පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| **01. -** 5 | **11. -** 3 | **21. -** 2 | **31. -** 2 |
| **02. -** 2 | **12. -** 5 | **22. -** 5 | **32. -** 4 |
| **03. -** 1 | **13. -** 5 | **23. -** 3 | **33. -** 2 |
| **04. -** 4 | **14. -** 2 | **24. -** 2 | **34. -** 1 |
| **05. -** 3 | **15. -** 1 | **25. -** 4 | **35. -** 3 |
| **06. -** 5 | **16. -** 4 | **26. -** 4 | **36. -** 1 |
| **07. -** 2 | **17. -** 2 | **27. -** 1 | **37. -** 5 |
| **08. -** 1 | **18. -** 3 | **28. -** 5 | **38. -** 2 |
| **09. -** 4 | **19. -** 5 | **29. -** 3 | **39. -** 3 |
| **10. -** 1 | **20. -** 3 | **30. -** 2 | **40. -** 4 |

### II කොටස




01. නිවැරදි ලකුණු කිරීමට හා නම් කිරීමකට ලකුණු 1 බැගිනි. ලකුණු 12 කි.

02. i.
- * භූගෝලීය බෙදීම්වලට පාදක වීම.
- * ගිරිදුර්ග, ජල දුර්ග, වන දුර්ග ආදියෙන් ආරක්ෂිත ප්‍රදේශයක් වීම.
- * ගම්පොල හා මහනුවර වැනි රාජධානි බිහිවීම.
- * ලංකාවේ ඒකාබද්ධ පාලනයට බාධාවක් වීම.
- * දෙස් විදෙස් ආක්‍රමණ හමුවේ රජවරුන් ආරක්ෂාව සඳහා රැකවරණය පැතීම.
- * ගංගා පෝෂක ප්‍රදේශයක් වීම.
- * කුළුබඩු වර්ග, මුතු මැණික් වැනි සම්පත් බහුල වීම.
- * වතු වගාව ව්‍යාප්තවීම.
- * නිදහස් අරගල ආරම්භ වූ ප්‍රදේශයක් වීම.

ii.
- * ලංකාව දූපතක් වීම.
- * ලංකාව වටා පිහිටි කඩතොළු පිහිටීම නිසා රට වටා වරායන් බහුලව පැවතීම. (උදාහරණ සැපයීම)
- * වරායන් ආක්‍රමණ සංක්‍රමණවලට උපයෝගී වූ බව උදාහරණ දෙමින් විස්තර කිරීම.
  - **ආර්ය සංක්‍රමණ.**
  - **දකුණු ඉන්දීය ආක්‍රමණ.**
  - **ලාංකික රජවරුන් යුධ ආධාර ලබාදීම හා ලබා ගැනීම.**
  - **විවාහ සබඳතා ඇතිවීම.**

- **මහින්දාගමනය / සංඝමිත්තාගමනය.** - **දළඳා වහන්සේ වැඩම කිරීම.**
- **දළඳා වහන්සේ වැඩම කිරීම.** - **පත්තිනි දේව ඇදහිල්ල ආරම්භ වීම.** ආදි උදාහරණ
* වෙළෙඳ කටයුතු ප්‍රචලිතවීම නිසා ආර්ථික සංවර්ධනය. * යුරෝපා ජාතීන් ලංකාව දෙසට අවධානය යොමු කිරීම.
* ත්‍රිකුණාමල වරායේ පිහිටීම.

03. i. 1. ප්‍රාග් ඓතිහාසික ගල් යුගය. (ල. 1)
ii. පුරාතන ශිලා යුගය හා මධ්‍ය ශිලා යුගය (ල. 2)
iii. * දඩයම හා වන ද්‍රව්‍ය රැස් කිරීම ප්‍රධාන ජීවනෝපාය මාර්ගයවීම.
* එළිමහන් ස්ථාන හා ගල් ගුහා ජනාවාස ලෙස තෝරා ගැනීම.
- **වියළි කාලවලදී එළිමහන් ස්ථානවල** - **වර්ෂා කාලයේදී ගල් ගුහාවල**
* කුඩා පවුල් ඒකක ලෙස ජීවත්වීම.
* සංචාරී දිවිපෙවතට ප්‍රිය කිරීම.
* ජනාවාස තෝරා ගැනීමේ දී ආහාර, ජලය පහසුවෙන් ලබාගත හැකිවීම හා ශිලා මෙවලම් තනා ගැනීමට අවශ්‍ය පාෂාණ වර්ග පහසුවෙන් ලබාගත හැකි ප්‍රදේශ පිළිබඳ අවධානය.
* පවුලේ සාමාජිකයන් මියගිය විට අවමංගල අභිචාරවිධි අනුගමනය. (ල. 5)
iv. * යකඩ මෙවලම්
* ශිලා මෙවලම්
* පිළිස්සූ මැටි වළං භාවිතය
* ශිලා මෙවලම් වෙනුවට ක්‍රමයෙන් යකඩ මෙවලම් භාවිතය
* පිළිස්සූ මැටි වළං භාවිතය
* නිවාස ඉදිකිරීමේ තාක්‍ෂණය
* සුසාන ඉදිකිරීමේ තාක්‍ෂණය
* මැටි පබළු / ලෝහ පබළු නිපදවීමේ තාක්‍ෂණය
- ස්ථිරවාසීතාව ඇති වී කෘෂිකර්මාන්තයට ගැඹුරුවීමත් සමඟ කෘෂිකර්මාන්තයට හා නිවෙස්වල එදිනෙදා පරිහරණය සඳහා අවශ්‍ය උපකරණ හා මෙවලම් ඉදිකිරීම සඳහා යකඩ භාවිතය.
- එදිනෙදා අවශ්‍යතා වෙනුවෙන් හා සුසාන ක්‍රම සඳහා අවශ්‍ය මැටි බඳුන් නිපදවීම හා නිවාස ඉදිකිරීම සඳහා තාක්‍ෂණය භාවිතා කිරීම සුදුසු මැටි වර්ගය තෝරා ගැනීම, අවශ්‍ය පරිදි පදම් කිරීම, සකපෝරුව භාවිතයෙන් මැටි බඳුන් නිපදවීම, වියළීම, වර්ණ කිරීම හා පිළිස්සීම.
- නිවාස ඉදිකිරීමේ දී පොළව ගිලා නොබසින ලෙස සකස් කිරීම. පොළවට ලම්භකව බිත්ති බැඳීම හා වහළ නොතෙමෙන පරිදි සකස් කිරීම සඳහා තාක්‍ෂණය භාවිත කිරීම.
- මැටි ඔරු නිපදවීමේ දී මැටි බඳුන් නිපදවීමේ තාක්‍ෂණික ක්‍රම හා දහනය සඳහා වාතය ලබා ගැනීමට සඳහා තාක්‍ෂණය භාවිත කිරීම.
- රංචාමඩම නේවාසික ප්‍රදේශයේ තිබී හමු වූ මැටි බබුළු හා රූපලාවන්‍ය උපකරණ අනුව ඒ සඳහා තාක්‍ෂණය භාවිතකර ඇති බවට සාධක හමුවේ. (ල. 8)

04. i. යක්‍ෂ, නාග, දේව, රාක්‍ෂ (ල. 2)
ii. * විජය කුමරු ඇතුළු පිරිස * විජායි කුමරිය ඇතුළු පිරිස
* පණ්ඩුවාසදේව කුමරු ඇතුළු පිරිස * භද්දකච්චායනා කුමරිය ඇතුළු පිරිස
* මහින්දාගමනය * සංඝමිත්තාගමනය (ල. 4)
iii. ජනාවාසවල ස්වරූපය
* කුඩාගම් වැව් කේන්ද්‍ර කරගනිමින් ගමක් ලෙස ජනාවාස ව්‍යාප්ත වීම.
* මෙම යුගයේ ජනාවාස වාපී ගම්මාන ලෙස හැඳින්වේ.
* වැව, කුඹුරු යාය, හේන, නිවස, කැලෑව ආදිය මෙම ජනාවාසවල ප්‍රධාන ලක්‍ෂණ වීම.
* එක් ගමක පවුල් 5 - 25 අතර ප්‍රමාණයක් ජීවත්වීම.
* ගමික වරයා ගමේ නායකයා වීම.
* මුල් කාලීන ගම් වෙන් වෙන්ව පිහිටා තිබීම.
* පසුකාලීන ගම්මාන එකට ඒකාබද්ධව පැවතීම.
* ජනගහනය වර්ධනයට සාපේක්‍ෂව ආහාර නිෂ්පාදන වැඩි කිරීම සඳහා විශාල වැව් ඉදිකිරීම සඳහා යොමු වීම.

ජීවන රටාව
* කෘෂිකර්මාන්තයට මූලිකත්වය හිමිවීම. * කර්මාන්තවල නිරත පිරිස් සිටීම.
* වෘත්තීන් අනුව ගම්මාන බෙදී පැවතීම. * සෙල්ලිපිවල සඳහන් තොරතුරු ඇසුරෙන් විස්තර කර තිබීම.(ල. 16)

05. i. * සද්ධාතිස්ස රජුගේ බාලම පුත්‍රයා වේ. * බ්‍රාහ්මණ හා ජෛන විරෝධයක් පැවතීම.
* රාජවාසල තුළ අභ්‍යන්තර ආරවුල් පැවති සමයක් වීම.
* වළගම්බා රජුගේ සහෝදරයා වූ බල්ලාට නාග රජු මරා මහරක්තක සෙනෙවි මරා රාජ්‍ය පැහැර ගැනීම.
* රජුගේ සහෝදරියගේ පුතුන් තිදෙනා රාජ්‍ය පැහැරගැනීමට උත්සාහකර එය ව්‍යර්ථ වූ පසු ජෛන ආරාමයකට පැන දිවිතොරකර ගැනීම.
* රුහුණේ නකුළ නගරයේ විසූ තීය බ්‍රාහ්මණයා රජුට විරුඩ්ධව කැරළි ගැසීම.
* සත් ද්‍රවිඩ ආක්‍රමණය. * ගිරි නිගණ්ඩයා රජුට විරුද්ධව ඔත්තු සැපයීම.
* වනගතව සේනා සංවිධානය. * බැමිණිතියා සාගතය ඇති වීම.
* ද්‍රවිඩයන් පරදවා ජය ගැනීම. * ලංකාව එක්සේසත් කිරීම.
* අභයගිරි විහාරය කරවා කුප්පික්කල තිස්ස හිමියන්ට පූජා කිරීම. * නිකාය බේදය.
* ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම. (ල. 16)

06. i. වසභ රජතුමා

ii. මින්නේරිය, හුරුළු වැව, කවුඩුලු වැව, මහකනදරා වැව

iii. **දක්ෂිණ දේශයේ පාලකයා ලෙස**

* පඩා වැව ඉදිකිරීම.
* දැදුරු ඔය ස්ථාන තුනකින් හරස්කර අමුණු බැඳ වගාවට අවශ්‍ය ජලය ලබා ගැනීම.
* පස් යොදුන් රට ප්‍රදේශයේ වගුරු බිම්වල ජලය බැසයාමට සලස්වා සරුසාර කුඹුරු ඉදි කිරීම.
* ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම.

**දිවයිනේම පාලකයා ලෙස**

* තෝපා, එරඹුදු, දුඹුටුළු ආදි වැව් ඒකා බද්ධ කර පරාක්‍රම සමුද්‍රය ඉදි කිරීම.
* රට අහරින් ස්වයංපෝෂිත කිරීම.
* සහල් පිටරට යැවීම.

iv.
* ගම්කවරුන්ගේ මූලිකත්වයෙන් ගම් වැව් ඉදිකිරීම හා සරල තාක්ෂණික උපක්‍රම භාවිතය.
* ජනගහනය වැඩිවීමට සාපේක්ෂව ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා මහ වැව් ඉදිකිරීමට සිදුවීම.
* වසභ රජතුමා මහ වැව් ඉදි කිරීමේ ආරම්භක පාලකයා වීම.
* මහ වැව් ඉදිකිරීම සඳහා ඉහළ තාක්ෂණයක් උපයෝගී කරගත හැකි වීම.
* මහ වැව් ඉදිකිරීමේ දී අතීත ජනයා මුහුණ දුන් අභියෝග විස්තර කිරීම.
* වැවක තාක්ෂණික අංග නම්කර විස්තර කර තිබීම. (ල. 8)

07. **දේශපාලනය**

* දඹදෙණිය රාජධානියේ වැදගත්ම පාලකයා වීම.
* චන්ද්‍රභානුගේ පළමු ආක්‍රමණය මර්ධන කල ආකාරය.
* කාලිංග මාඝ පරාජයට පත් කිරීම.
* චන්ද්‍රභානුගේ දෙවන ආක්‍රමණය වර්ධනය කිරීම.

**ආගමික**

* දඹදෙණි දළදා මාළිගය ඉදිකරවා දළදා වහන්සේ වැඩම කිරීම.
* දඹදෙණිය කතිකාවත කරවීම. (සංඝ සංශෝධනය)
* අනුරාධපුර පොළොන්නරු නගර ද රුවන් වැලි සෑය ද ප්‍රතිසංස්කරණය කිරීම.
* දාස් තොටේ දී උප සම්පදා උත්සවයක් පැවැත්වීම.
* වනවාසී භික්ෂු පරපුර පිහිටුවීම.
* කැලණි විහාරය ඇතුළු වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය
* රත්නපුර මහ සමන් දේවාලය ඉදිකිරීම. (ල. 16)

08.
* කෝට්ටේ හයවන පැරකුම් රාජ සමයේ දී සාමකාමී කාලවකවානුවක් පැවති බැවින් අධ්‍යාපන හා ශාස්ත්‍රීය අංශවල දියුණුව සඳහා අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය ලබා දීම.
* අධ්‍යාපනය නගා සිටුවීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබීම හා පිරිවෙන් ආරම්භ කිරීම.
  - වීදාගම සනාන්ද පිරිවෙන.
  - තොටගමුවේ විජයබා පිරිවෙන.
  - දෙවුන්දර ඉරුගල් කුලතිලක පිරිවෙන.
  - කැරගල පද්මාවතී පිරිවෙන.
  - පැපිලියානේ සුනේත්‍රා දේවී පිරිවෙන.
  - එරබත්තොට ධර්මරාජ පිරිවෙන
* පිරිවෙන්වල සිංහල, පාලි, සංස්කෘත, පාකෘත, දෙමළ ආදී භාෂාවන් ද කාව්‍යකරණය, නාට්‍ය හා ජ්‍යොතිෂ ශාස්ත්‍රය ආදී විෂයන් ඉගැන්වීම.
* අධ්‍යාපනය දියුණුවීම නිසා උගතුන් බිහිවීම.
* උගතුන් විසින් තරගකාරීව ග්‍රන්ථකරණයේ නිරත වීම. උදාහරණ සපයමින් විස්තර කර තිබීම. (ල. 16)

09. i. ඉතිහාසය විෂය හැඳින්වීම සඳහා ඉදිරිපත් වී ඇති නිර්වචන ඇසුරු කරගනිමින් ඉතිහාස විෂය හඳුන්වා තිබෙන ආකාරය විස්තර කිරීම.

ii.
* ජන සම්මතවාදී රාජාණ්ඩු පාලනය
* පණ්ඩුකාභය
* විධිමත් අග නගර නිර්මාණය
* දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දී මෞර්ය පාලන සංකල්පවල ආභාෂය ලැබීම.
* මෞර්ය අභිෂේක ක්‍රමය දයාද වීම.
* රාජ්‍ය පාලනය සඳහා නිලධාරී පිරිසකගේ සහය ලබා ගැනීම.
* පාලනයේ පහසුව තකා ලංකාව ප්‍රාදේශීය පාලන ඒකකවලට බෙදා පැවරීම. (රුහුණු, පිහිටි, මයා)
* ඇපා, මාපා, මහරජ අනුපිළිවෙළට රාජ්‍ය උරුම වීම.
* වසභ රජු පාලනයේ පහසුවට ලංකාව අස්ථානවලට බෙදා වෙන්කළ බවට මූලාශ්‍රවල තොරතුරු සඳහන් වීම.

ආදිය පිළිබඳ උදාහරණ සපයමින් විස්තර කිරීම.

iii.
* යාපන රාජධානියේ ආරම්භය
* අනෙකුත් / රාජධානි සමග පැවැත් වූ සබඳතා
* පෘතුගීසි / ලන්දේසි / ඉංග්‍රීසි පාලන සමයේ යාපන රාජ්‍ය පිළිබඳ තොරතුරු
* යාපන රාජ්‍ය පරපුර පිළිබඳ තොරතුරු ඇසුරෙන් විස්තර කර තිබීම.

iv.
* දුර්වල පාලකයින් බලයට පත්වීම - V මිහිඳු.
* අභ්‍යන්තර බල අරගල.
* චෝළ / පාණ්ඩ්‍ය වැනි විදේශ ආක්‍රමණ.
* ලංකාවේ ද්‍රවිඩ බලය වර්ධනය වීම.
* විදේශ රජවරු වස්තුව කොල්ලකාගෙන යාම / යුද්ධ සිහ දේපොල විනාශවීම නිසා ආර්ථික පරිහානිය
* රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා මෞර්ය - ලම්භකරණ පෙළපත් අතර සිදුවූ බල අරගලය.
* චෝළ ආක්‍රමණ
* මධ්‍යගත පාලනය බිඳ වැටීම. ආදිය මඟින් විස්තරකර තිබීම.